දෙපාර්තතෙමේන්තු චක්‍රලේඛ 6/2006

මගේ අංකය : ප/5/දෙපා.ච./2006

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පේරාදෙණිය.

2006.02. 27

අධ්‍යක්ෂ / ඒකක ප්‍රධානි

## කාර්යාලයෙන් බැහැරවීම හා නිවාඩු ලබා ගැනීම

දැනට ලෝකයේ රටවල් ගණනාවක සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින කුරුළු උණ රෝග අවදානම ශ්‍රී ලංකාවටද තර්ජනයක් විය හැකි බැවින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය අවශ්‍ය අවස්ථාවන්හිදී ලබා දීමට සූදානම්ව සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ගයන් ගැනීමට කටයුතු කළයුතුය.

1. අත්‍යවශ්‍ය අවස්ථාවලදී හැර නිවාඩු ලබා ගැනීමෙන් වැළකීම.
2. නිවාඩු ලබා ගන්නා අවස්ථාවන්හි හෝ වෙනත් රාජකාරි කටයුත්තක් සඳහා කාර්යාලයෙන් බැහැරව යන අවස්ථාවන්හිදී තමාට ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.
3. හදිසි අවස්ථාවන්හි නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා ඔවුන් බැහැරව යන ස්ථාන හා දුරකථන අංක අනිවාර්යයෙන්ම අධීක්ෂණ නිලධාරියා වෙත ලබා දීමට කටයුතු කිරීම.

02. මෙම ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් ඔබ යටතේ සිටින සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එච්.එම්.ආර්.පිලපිටිය
අධ්‍යක්ෂ (පරිපාලන).

අත්. කළේ / එස්.කේ.ආර්.අමරසේකර
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත :-

1. සියළුම පළාත් අධ්‍යක්ෂවරුන්ට - ඔබ පළාත් සභාව තුළද ඉහත ක්‍රියා මාර්ගය අනුගමනය කිරීම සඳහා.

කරු/23-